# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2400/14 – 2024 සැප්තැම්බර් මස 04 වැනි බදාදා – 2024.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස – පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

**ගිරිබාව ප්‍රාදේශීය සභාව**

විනෝද බදු පැනවීම

**1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වන උප වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.**

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අයකරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන උප වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වන උප වගන්තිය ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2023.10.25 දින අංක 904 යටතේ සටහන් කරමින් ගෙන ඇති තීරණය, වයඹ පළාතේ ආණ්ඩුකාරවර නසීර් අහමඩ් වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වන උප වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**නසීර් අහමඩ්,**
වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරවර.

2024 ජූලි මස 12 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A – PG 6853 – 05 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*තීරණය*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන උප වගන්තිය සමඟ කියවිය යුතු 1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වන උප වගන්තියෙන් ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුලුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් සියයට දහයට (10%) ට සමාන බද්දක් පනවා අය කළ යුතු යැයි ද 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වන උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව ගරු වයඹ ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ *ගැසට් පත්‍රයේ* පළ කිරීමටත් පෙරකී *ගැසට් පත්‍රය* පළ කරන මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු බවටත් තීරණය කරමි.

EOG 09 – 0032

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.